Article 12(1)

මගේ අංකය
எனது இல.
My No.

දිනය
திகதி
Date. 28/03/2016

ඔබේ අංකය
உமது இல.
Your No.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

පැමිණිලි පාර්ශවය : එච්.ජී වර්ණජිත් උදයප්‍රිය මයා.
අංක 272. ප්‍රදීපාගාර මාවත.
මල්අරඹ. දෙවිනුවර.

වින්දිත : එච්.ජී මංජුල මයා

වගඋත්තර පාර්ශවය : 01. පො.ප පුෂ්පකුමාර මයා.
ස්ථානාධිපති.
පොලිස් ස්ථානය. ගන්දර.

02 උ.පො.ප උපාලි මයා.
පොලිස් ස්ථානය.
ගන්දර.

පැමිණිලි අංකය : **HRC/MT/232/15**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ වගඋත්තරකරුවන් විසින් තම සහෝදරයා වන ජී.පී මංජුල යන අයව ද්වේශ සහගත ලෙස අත්අඩංගුවට ගත් බවයි.

තම මව වන පී.පී.එච් සෝමලතා යන අයට විරුද්ධව මල්ලිකා නැමැත්තිය විසින් ඉඩම් ආරවුලක්/ඉදිකිරීමක් පිළිබඳව ගන්දර පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ලක් විමර්ශනය කිරීම සඳහා 2015.06.12 දින ගන්දර පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට 2015.06.11 දින තම නිවසට පැමිණි ගන්දර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් තම මවට කරන ලද දැනුම්දීමට අනුව එදින තම මව සමග පොලිස් ස්ථානයට ගිය තම සහෝදරයා අත්අඩංගුවට ගෙන සිරමැදිරියේ

රැඳවීම තුළින් තම සහෝදරයාගේ මානව හිමිකම් උල්ලංඝනය කරන ලද බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.

වින්දිත එච්.ජී.පී මංජුල යන අය විසින්ද පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් තම මව සමඟ 2015.06.12 දින පොලිස් ස්ථානයට යාමට සූදානම් වී සිටියදී උදේ 7 ට පමණ අසල්වැසි යූ.ඩබ්. චමිලා නැමැත්තිය විසින් "මංජුලට රතිකා ගෙදරට ඇවිත් යන්න කිවුවා (මල්ලිකා යන අයගේ සහෝදරිය)" යන පණිඩය මත මල්ලිකා යන අයගේ නිවසට ගොස් රතිකා යන අය හමු වූ බවත් එහි සිටි මල්ලිකා යන අය පැමිණ තම ඉඩම හරහා ඇයගේ ඉඩමට යාමට පාරක් ලබා දෙන ලෙසත් එසේ පාර ලබා දෙන්නේ නම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල ඉවත් කර ගන්නා බවත් මල්ලිකා යන අය විසින් දැනුම් දුන් බවත් තමා එයට විරුද්ධත්වය ප්‍රකාශ කොට මේ වන විටත් පොලීසියෙන් කැඳවා ඇති බැවින් එහිදී බලාගනිමුයැයි පවසා නැවත පැමිණි බවත් සඳහන් කර ඇත. පසුව එදින පොලිස් නිලධාරින් විසින් පෙර දින දැනුම්දී ඇති පරිදි මව සමඟ ගන්දර පොලිස් ස්ථානය වෙත යන විට මල්ලිකා නැමැත්තිය පොලිස් ස්ථානාධිපතිගේ නිල කාමරයේ සිටි බවත් තමන් සහ මව එහි කැඳවූ ස්ථානාධිපතිවරයා තමන්ගෙන් කිසිත් නොවිමසා අත්අඩංගුවට ගැනීමට නියෝග කළ බවත් තමන් අත්අඩංගුවට ගෙන සිරමැදිරියේ රඳවා තබා ගැනීමෙන් පසුව ප.ව 11.10ට ප්‍රකාශයක් ලබා ගත් අතර එම අවස්ථාවේදී "මල්ලිකා යන අයට මරණ තර්ජණය කිරීම හා අයුතු ඇතුල්වීමක් කිරීමේ" චෝදනාවට අත්අඩංගුවට ගත් බව දැනගැනීමට ලද බවත් තමන් මල්ලිකා යන අයගේ නිවසට ගිය බව පිළිගන්නා අතර එසේ යන ලද්දේ යූ.ඩබ්. චමිලා යන අයගේ දැනුම්දීමට අනුව බවත් ඒ බවට චමිලා යන අය සහ රජිකා යන අයවලුන් සාක්ෂි දරණ බවත් කිසිම අවස්ථාවක මල්ලිකා යන අයගේ නිවසට අයුතු ඇතුල්වීමක් හෝ මරණ තර්ජණ කිරීමක් නොකළ බවත් දක්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

ගන්දර පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පො.ප පුෂ්පකුමාර මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2015.06.11 දින CIB 317/159 යටතේ ඉඩමකට අවහිර වන සේ කඩකාමරයක් සෑදීම හා නඩුවක් පවතින ඉඩමක නැවත එම කඩකාමරය අළුත්වැඩියා කරමින් පවතින බවට සෝමලතා යන අයට (මෙම වින්දිතයාගේ මව) එරෙහිව ලද පැමිණිල්ල විවිධ පැමිණිලි අංශයේ නිලධාරීන් විසින් විමර්ශනය කිරීමෙන් පසු එහි වැඩිදුර විභාගය සඳහා 2015.06.12 දින උදෑසන 9.00 ට පාර්ශවයන් කැඳවූ බවත්,

නැවත මිරිස්සගේ මල්ලිකා ද සිල්වා නැමැත්තිය විසින් CIB I 333/172 යටතේ 2015.06.12 දින පෙ.ව 8.30 ට පැමිණිල්ලක් කරමින් සෝමලතා යන අයගේ පුතා වන මංජුල යන අය නිවසට පැමිණ තමාට මරණ තර්ජණ කළ බවට සඳහන් කරමින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ල ක්ෂණිකව විභාග කිරීම සඳහා විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උ.පො.ප උපාලි යන අයට භාරදුන් බවද ඒ අනුව මංජුල යන අය අයුතු ඇතුල්වීම හා මරණ තර්ජණ කිරීම යන චෝදනා මත අත්අඩංගුවට ගත් බවද මෙම පැමිණිල්ලේ විමර්ශන කටයුතු උ.පො.ප උපාලි විසින් සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත.

දෙවන වගඋත්තරකාර උ.පො.ප උපාලි යන අය විසින් ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ අධිකරණයේ නඩුවක් පවතින ඉඩමක අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් 2015.06.1 වන දින CIB I 317/159 යටතේ ලද පැමිණිල්ල ස්ථානාධිපතිතුමාගේ නියෝග පරිදි විමර්ශනය කිරීමට ස්ථානයට ගියද එහි පැරණි කඩකාමරයක් තිබූ බවත් ඉදිරිපස ඉටිකොල යොදා ආවරණය කර තිබූ ගොඩනැගිල්ල අලුත්වැඩියාවක් කර නොතිබූ බවත්.

වැඩිදුර ප්‍රකාශයක් මගින් 2015.06.12 දින CIB I 333/172 යටතේ "නිවසට පැමිණ මරණ තර්ජණ කිරීමක්" පිළිබඳව මංජුල යන අයට එරෙහිව ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ බැවින් හා 2015.06.11 CIB I 317/159 යටතේ පැමිණිල්ලේ වගඋත්තරකරුවන්ද මොහු වූ හෙයින් 2015.06.12 දින උදේ 9.00 ට දෙපාර්ශවය පොලිස් ස්ථානයට කැඳවා තිබූ බැවින් ස්ථානාධිපතිතුමා විසින් ඔහුගේ කාර්යාලයේදී විභාග කොට මංජුල යන අය "අයුතු ඇතුල්වීම හා මරණ තර්ජණය කිරීම" යන චෝදනා මත අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට තමා හට දැනුම්දුන් බවද තමන් මෙම අත්අඩංගුවට ගැනීම පිළිබඳව විමර්ශනය නොකළ බවද දක්වා ඇත.

ස්ථානාධිපතිවරයාගේ උපදෙස් පරිදි අදාළ සැකකරුව අත්අඩංගුවට ගෙන සිරමැදිරියේ රැඳවූ බවද ඉඩම් ආරවුලක් පිළිබඳව දෙපාර්ශවයට අධිකරණයේ නඩු පවරා ගැනීමට උපදෙස් දී සමථ කළ බවද එදින සැකකාර මංජුල යන අය පැය 12.35 ට ඇප මත මුදා හැරි බවද දක්වා ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනය සහ නිරීක්ෂණ :-

2015-06-11 දින CIB I 317/159 යටතේ පොලිස් ස්ථානය වෙත ලැබී ඇති මුල් පැමිණිල්ල ප්‍රබෝදා ෂෙරි අබේසේකර විසින් ඇයගේ නැන්දා වන මල්ලිකා පරනහේවා යන අය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් වේ. එහි තමන් නැන්දාගේ හෝටලයේ සිටින විට නැන්දාට අයත් ඉඩමේ සෝමලතා යන අය විසින් සාදා තිබූ කඩකාමරයේ ඉතිරි වැඩද අවසන් කර කඩයක් දැමීමට සූදානම් වන බවට තොරතුරක් ලැබුනු බවත් ඒ අනුව එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලූ බවත් කඩයක් ඉදිකරනු තමන් නොදුටු බවත් එහෙත් එම ස්ථානයේ පිරිසක් සිටි බවත් නැන්දාගේ උපදෙස් පරිදි පොලිස් ස්ථානයට පැමිණිලි කළ බවත් එහි සඳහන් වේ.

ඉහත පැමිණිල්ල ගන්දර පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උ.පො.ප උපාලි හා පො.ප 68355 බණ්ඩාර යන අය සමඟ ස්ථාන පරීක්ෂාවක් කළ බවද එම ස්ථානයේ පැරණි ගොඩනැගිල්ලක් තිබූ බවද අලුත් ඉදිකිරීමක් එහි නොවූ බවට නිරීක්ෂණය වූ බවද උ.පො.ප උපාලි නිලධාරි විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති 2015.10.09 දිනැති ප්‍රකාශයෙන් අනාවරණය වේ.

ඉහත ප්‍රකාශයන් අනුව CIB I 317/159 පැමිණිල්ල සත්‍යයෙන් තොර පැමිණිල්ලක් බව නිරීක්ෂණය වී ඇත.

2015.08.25 දින මීට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාවේදී සිදුකරන ලද පරීක්ෂණයේදී මල්ලිකා පරණහේවා නැමැත්තියට අයත් ඉඩමකට අවහිර වන සේ කඩකාමරයක් සාදා එම අවහිර කිරීම පිළිබඳව නඩුවක් පවතින බවත් දැනට කඩකාමරය සෑදීම අත්හිටුවා ඇති බව ප්‍රකාශ කර ඇතත් පොලිස් ස්ථානයට ලැබී ඇති මුල් පැමිණිල්ල වන CIB I 317/159 දරණ පැමිණිල්ල හා එහි වැඩිදුර ප්‍රකාශය වන 2015.06.12 දිනැති අංක CIB 333/172 දරණ පැමිණිල්ලෙහි "ඉඩමට තවම නඩු දාලා නැහැ" යනුවෙන් පැමිණිලිකාරිය සඳහන් කොට ඇති කරුණු කෙරෙහි හෝ මෙම පරීක්ෂණයේදී අවධානයට ලක්කොට නොමැති බවද නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලෙහි වින්දිත එච්.ඩී.පී මංජුල යන අය 2015.06.12 දින පෙ.ව 9.05 ට අත්අඩංගුවට ගෙන සිරමැදිරියේ රඳවා ඇති බව CIB I 334/173 පරිදි නිරීක්ෂණය වන අතර ඔහුගේ ප්‍රකාශය පැය 11.10 ට CIB I 338/177 යටතේ ලේඛනගත කර ඇති බවත් එකී ප්‍රකාශයේ මල්ලිකා මහත්මියගේ නිවසේ සිටින නංගි රතිකා සහ යූ.ඩබ්. චමිලා පැමිණ "මල්ලිකා අක්කා ගෙදරට ඇවිත් යන්න කිව්වා" යනුවෙන් ප්‍රකාශ කර ඇති බවත් එම දැනුම්දීම මත එකී නිවසට ගිය පසු ඇයගේ ඉඩමට යාමට පාරක් තමන්ගේ කඩකාමරය කඩා ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවත් පාර ලබා දෙන්නේ නම් පැමිණිල්ල ඉල්ලා අස්කරගන්නා බව ප්‍රකාශ කළ බවත් දක්වා ඇති අතර එය තමා විසින් ප්‍රතික්ෂේප කළ බවටද ප්‍රකාශ කොට ඇත.

ඉහත කරුණු සලකා බැලීමේදී අගතියට පත් මංජුල යන අය මල්ලිකා යන අයගේ නිවසට යනු ලබන්නේ යූ.ඩබ් චමිලා නැමැත්තියගේ දැනුම්දීමට අනුව හා මල්ලිකා යන අයගේ කැඳවීමට අනුව බව අනාවරණය වේ.

වින්දිත මංජුල යන අය අත්අඩංගුවට ගැනීමට පෙර ඔහුගේ නිර්දෝෂීභාවයට කරුණු දැක්වීම සඳහා අවස්ථාව ලබා දී නොමැති අතර පණිවිඩය ගෙන එනු ලබන යූ.ඩබ් චමිලා නැමැත්තියගේ ප්‍රකාශ හෝ ලබාගැනීමකින් තොරව අයුතු ඇතුල්වීමක් ලෙස සලකා මෙම වින්දිත මංජුල යන අයව අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල නොවන බවද නිරීක්ෂණය වේ.

පළමු වගඋත්තර පාර්ශවය කරුණු දැක්වීමේදී උ.පො.ප උපාලි යන අය විසින් විමර්ශනයක් කළ බව ප්‍රකාශ කළද උ.පො.ප උපාලි නිලධාරීගේ ප්‍රකාශයට අනුව ස්ථානාධිපති විසින් විමර්ශනයක් කළ බවට දක්වා තිබීම පරස්පරවිරෝධී වන බවද නිරීක්ෂණය වේ.

මංජුල යන අයව අත්අඩංගුවට ගැනීමට පෙර මෙම කරුණු පිළිබඳව කිසිදු විමර්ශනයක් කිසිදු නිලධාරියෙකු විසින් සිදුකොට නොමැති බවද නිරීක්ෂණය වේ.

එමෙන්ම 2015.06.11 දින ඉදිරිපත් වී ඇති පැමිණිල්ලට අනුව කඩකාමරය අලුත්වැඩියා කිරීම හෝ අලුතින් සෑදීම නොකරන බවට විමර්ශනය සඳහා ගිය නිලධාරීන් හට නිරීක්ෂණය වීම මෙලෙස අත්අඩංගුවට ගැනීම පිළිබඳව සැළකිලිමත් වීමට අත්‍යාවශ්‍ය සාධකයකි.

2015.06.11 දිනැති CIB I 317/559 පැමිණිල්ල කෙරෙහි අවධානය යොමු කිරීමේදී "එහි කඩේ හදනවද කියලා මම ගිහින් බැලුවා එතන කට්ටිය ගොඩක් වටවෙලා හිටියා. කඩේ හදනවද කියලා දන්නේ නැහැ" යනුවෙන් සඳහන් වේ.

ඒ අනුව එකී පැමිණිල්ල මඟින් මංජුල යන අයට එරෙහිව සෘජු චෝදනාවක් ඉදිරිපත් නොකරයි. එමෙන්ම එකී පැමිණිල්ලේ වැඩිදුර තොරතුරු විමර්ශනයට ගනු ලැබූ විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උ.පො.ප උපාලි යන අයට ද එකී ස්ථානයෙහි ඉදිකිරීමක් නිරීක්ෂණය නොවූ බවට ප්‍රකාශ කරන අවස්ථාවක ඊට සමගාමීව ලැබෙන අයුතු ඇතුල්වීම මරණීය තර්ජණය කිරීමේ පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණ නිලධාරීන් විමසිලිමත්ව සොයා බැලීමකින් තොරව වින්දිත මංජුල යන අය අත්අඩංගුවට ගෙන සිරමැදිරියේ රඳවා තබා ඇති බවද නිරීක්ෂණය වේ.

පසුව සිරමැදියෙන් පිටතට ගනු ලැබූ මංජුල යන අයට තම කඩ කාමරය කඩා මල්ලිකා යන අයගේ ඉඩමට යාමට පාරක් ලබා දෙන ලෙසට ස්ථානාධිපතිවරයා විසින් බලපෑම් කළ බවද මෙකී පරීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇත. එකී ප්‍රකාශයන්ට වගඋත්තර පාර්ශවය විසින් කිසිදු විරෝධතාවයක් නොදැක්වීම අදාළ කරුණ සනාථ කරන්නක් වන බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32(1) අ වගන්තිය ප්‍රකාරව යම් සංඥය වරදකට සම්බන්ධ වූ හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තෙකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී ඇත්නම් අත්අඩංගුවට ගැනීමේ බලය පොලිස් නිලධාරීන් සතු වෙයි. මෙම ප්‍රශ්නගත අවස්ථාවේ වගඋත්තරකරුවන් විසින් එකී නෛතික බලය ක්‍රියාවේ යෙදවීමේදී පැමිණිල්ලේ සාධාරණත්වය පිළිබඳව විමසා බැලිය යුතු නමුත් එකී කාර්යයන් ඉටු වී නොමැති බව නිරීක්ෂණය වේ.

උක්ත සියළු කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවට අනුව "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය" යන්න සහ එහි 13(1) ව්‍යවස්ථාවට අනුව "නීතිය නියම කර ඇති කාර්යය පටිපාටියට අනුකූලව මිස තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය" යන මූලික අයිතීන් පැමිණිල්ලෙහි දැක්වෙන වින්දිත එච්.ජී.පී මංජුල යන අය විෂයෙහි උල්ලංඝනය වී ඇති බවත් ඒ සඳහා 1 හා 2 වගඋත්තරකරුවන් වගකිවයුතු බවටත් මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

- 1 වන හා 2 වන වගඋත්තරකරුවන් විසින් අගතියට පත් පාර්ශවය වෙත රු. 10,000/- බැගින් ගෙවිය යුතුය.

2018. 05. 02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය

B/